# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

**2021 මාර්තු**

**03 වෙළුම 03 නිකුතුව**

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය




### මාසික ආනයන ක්‍රියාකාරිත්වය




2021 වසරේ මාර්තු මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 1,094ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 66.7කින් ඉහළ ගියේය.

2021 වසරේ මාර්තු මාසයේ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,926ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 59.8කින් ඉහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් මිලියන)




2021 වසරේ මාර්තු මාසයෙන් අවසාන වන මාස තුන තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 12.6කින් ඉහළ ගිය අතර, ආනයන වියදම ද සියයට 12.0කින් ඉහළ ගියේය.

වෙළඳ හිඟය 2020 වසරේ මාර්තු මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 549ට සාපේක්ෂව 2021 වසරේ මාර්තු මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 832ක් දක්වා වැඩි විය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2021 ජන.- මාර්තු )



# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන.-මාර්තු)




### අපනයන පරිමා දර්ශකය - (ජන.-මාර්තු)




සියලුම ප්‍රධාන කාණ්ඩවල අපනයන ඉහළ යෑම හේතුවෙන් 2021 වසරේ මාර්තු මාසයෙන් අවසාන වන මාස තුන තුළ දී අපනයන ආදායම ඉහළ ගියේය.

සියලුම ප්‍රධාන කාණ්ඩවල අපනයන පරිමාවන්ගේ ඉහළ යෑම හේතුවෙන් 2021 වසරේ මාර්තු මාසයෙන් අවසාන වන මාස තුන තුළ දී අපනයන පරිමා දර්ශකය ඉහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන

### කෘෂිකාර්මික අපනයන ආදායම




### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-මාර්තු)




### තේ සහ රබර් මිල ගණන් *




*කොළඹ වෙන්දේසි මිල ගණන් මත පදනම් වන අතර 2020 වසරේ අප්‍රේල් - අගෝස්තු කාලපරිච්ඡේදයේ රබර් වෙන්දේසි මිල ගණන් නොමැත.

තේ වෙන්දේසි මිල ගණන් - 2020 | තේ වෙන්දේසි මිල ගණන් - 2021
රබර් වෙන්දේසි මිල ගණන් - 2020 | රබර් වෙන්දේසි මිල ගණන් - 2021

ප්‍රධාන වශයෙන් කුළුබඩු (විශේෂයෙන් කුරුඳු) සහ තේ අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් 2021 වසරේ මාර්තු මාසයෙන් අවසාන වන මාස තුන තුළ දී කෘෂිකාර්මික අපනයන ආදායම ඉහළ ගියේය. කෙසේ වුවද, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, මුහුදු ආහාර සහ එළවළු අපනයන ආදායම පහත වැටුණි.

# කාර්මික අපනයන

## කාර්මික අපනයන ආදායම




## කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




## කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-මාර්තු)




## නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්




2021 වසරේ මාර්තු මාසයෙන් අවසාන වන මාස තුන තුළ දී කාර්මික අපනයන ආදායම ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඇඟලුම් සහ රබර් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. කෙසේ වුවද, ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායම කැපී පෙනෙන ලෙස පහළ ගියේය.

# ආනයන ක්‍රියාකාරිත්වය

## ආනයන ක්‍රියාකාරිත්වය - (ජන.-මාර්තු)




## ආනයන පරිමා දර්ශකය (ජන.-මාර්තු)




2021 වසරේ මාර්තු මාසයෙන් අවසාන වන මාස තුන තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම ඉහළ ගිය අතර, මේ සඳහා සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන වියදම් ඉහළ යෑම හේතු විය. මේ අතර, සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන පරිමාවන් ඉහළ යෑම හේතුවෙන් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී ආනයන පරිමා දර්ශකය ඉහළ ගියේය.

## පාරිභෝගික භාණ්ඩ ආනයන

### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම




### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-මාර්තු)




### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන්




මුහුදු ආහාර සහ සහල් ආනයන පහළ යෑම හමුවේ වුවද, ප්‍රධාන වශයෙන් සීනි සහ තෙල් හා මේද ඇතුළු ආහාර හා පාන වර්ග ආනයන වියදම ඉහළ යාම හේතුවෙන් 2021 වසරේ මාර්තු මාසයෙන් අවසාන වන මාස තුන තුළ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. මේ අතර පෞද්ගලික රථවාහන ආනයන පහළ යෑම සමඟ ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ වියදම අඩු වූ අතර, විදුලි සංදේශ මෙවලම් ආනයන වියදම ඉහළ ගියේය.

## අන්තර් භාණ්ඩ ආනයන

### අන්තර් භාණ්ඩ ආනයන වියදම




### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



**අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-මාර්තු)**




**බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)**




*2021 වසරේ මාර්තු මාසයේ දී බොරතෙල් ආනයනය කර නැත.

ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන ඉහළ යෑම හේතුවෙන්, 2021 වසරේ මාර්තු මාසයෙන් අවසාන වන මාස තුන තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුවද, ඛනිජ නිෂ්පාදිත සහ ආහාර සැකසුම් ආනයන වියදම් පහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයනය

**ආයෝජන භාණ්ඩ ආනයන වියදම**




**ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක**




**ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-මාර්තු)**




යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණවල ඉහළ ආනයන වියදම හේතුවෙන්, 2021 වසරේ මාර්තු මාසයෙන් අවසාන වන මාස තුන තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | මාර්තු - 20 | මාර්තු - 21 | වෙනස (%) | ජන. -මාර්තු 2020 | ජන.-මාර්තු 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **122.7** | **257.3** | **109.8** | **506.5** | **663.8** | **31.0** |
| එයින් | තේ | 62.5 | 124.6 | 99.3 | 270.1 | 338.1 | 25.2 |
| | පොල් | 19.7 | 41.2 | 109.2 | 70.4 | 96.3 | 36.7 |
| | කුළුබඩු | 12.9 | 38.6 | 199.1 | 51.0 | 113.8 | 122.9 |
| | මුහුදු ආහාර | 12.8 | 25.4 | 98.9 | 57.0 | 56.4 | -1.1 |
| **කාර්මික අපනයන** | | **531.4** | **829.8** | **56.2** | **2,134.1** | **2,302.4** | **7.9** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 312.7 | 467.2 | 49.4 | 1,254.9 | 1,333.5 | 6.3 |
| | රබර් නිෂ්පාදිත | 54.5 | 95.2 | 74.8 | 196.2 | 256.3 | 30.7 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 37.0 | 28.8 | -22.3 | 177.7 | 85.8 | -51.7 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 38.1 | 51.0 | 33.7 | 110.3 | 132.4 | 20.0 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 21.1 | 44.2 | 109.2 | 86.4 | 124.9 | 44.6 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 8.4 | 27.7 | 228.5 | 54.6 | 70.8 | 29.7 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 3.7 | 3.2 | -12.8 | 16.6 | 11.2 | -32.7 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **2.2** | **6.7** | **208.7** | **9.1** | **16.0** | **77.0** |
| **මුළු අපනයන** | | **656.2** | **1,093.8** | **66.7** | **2,649.6** | **2,982.2** | **12.6** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | මාර්තු - 20 | මාර්තු - 21 | වෙනස (%) | ජන. -මාර්තු 2020 | ජන.-මාර්තු 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **267.1** | **379.6** | **42.1** | **966.1** | **997.9** | **3.3** |
| ආහාර හා පාන වර්ග | | 143.0 | 189.7 | 32.6 | 426.4 | 505.3 | 18.5 |
| එයින් | එළවළු (අ) | 38.8 | 43.4 | 12.0 | 104.7 | 111.1 | 6.1 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | | 124.0 | 189.9 | 53.1 | 539.7 | 492.6 | -8.7 |
| එයින් | පෞද්ගලික රථවාහන | 39.5 | 1.0 | -97.4 | 156.4 | 2.4 | -98.4 |
| **අන්තර් භාණ්ඩ** | | **699.7** | **1,129.9** | **61.5** | **2,545.7** | **2,990.7** | **17.5** |
| එයින් | ඉන්ධන | 237.7 | 347.2 | 46.1 | 948.2 | 977.2 | 3.0 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 139.3 | 250.9 | 80.2 | 622.0 | 710.2 | 14.2 |
| | පොහොර | 6.7 | 16.3 | 144.3 | 25.9 | 35.0 | 35.2 |
| | තිරිඟු හා ඉරිඟු | 62.5 | 31.1 | -50.3 | 79.8 | 93.5 | 17.1 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **238.2** | **416.5** | **74.8** | **990.9** | **1,052.5** | **6.2** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 130.2 | 274.6 | 110.8 | 572.4 | 685.1 | 19.7 |
| **මුළු ආනයන** | | **1,205.0** | **1,925.9** | **59.8** | **4,502.7** | **5,041.1** | **12.0** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | මාර්තු - 20 | මාර්තු - 21 | වෙනස (%) | ජන. -මාර්තු 2020 | ජන.-මාර්තු 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -548.8 | -832.2 | - | -1,853.1 | -2,059.0 | - |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ආ)

| කාණ්ඩය | | මාර්තු - 20 | මාර්තු - 21 | වෙනස (%) | ජන. -මාර්තු 2020 | ජන.-මාර්තු 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 91.3 | 152.2 | 66.7 | 122.9 | 138.4 | 12.6 |
| | පරිමා දර්ශකය | 107.4 | 168.0 | 56.5 | 130.0 | 144.6 | 11.3 |
| | මිල දර්ශකය | 85.1 | 90.6 | 6.5 | 94.6 | 95.7 | 1.2 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 107.8 | 172.4 | 59.8 | 134.3 | 150.4 | 12.0 |
| | පරිමා දර්ශකය | 139.4 | 196.0 | 40.6 | 156.6 | 171.1 | 9.2 |
| | මිල දර්ශකය | 77.4 | 87.9 | 13.6 | 85.8 | 87.9 | 2.5 |
| **වෙළඳ මිල අනුපාතය** | | 109.9 | 103.0 | -6.3 | 110.3 | 108.8 | -1.3 |

(අ) පරිප්පු, ළූණු,අර්තාපල්, රතිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.
(ආ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද